# ඇසුරු කළ යුත්තේ කවුරුන් ද
# ඇසුරු නොකළ යුත්තේ කවුරුන් ද
## පුද්ගල වර්ගය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අඞ්ගුත්තර නිකාය 1 - පිටු අංක 232 - 233)

මෙලොව පුද්ගලයන් තිදෙනෙක් දක්නට ලැබෙයි.

කවර තිදෙනෙක් ද යත්;

1. සේවනය නොකළ යුතු, ඇසුරු නොකළ යුතු, පයිරුපාසන නොකළ යුතු පුද්ගලයෙක් ඇත.
2. සේවනය කළ යුතු, ඇසුරු කළ යුතු, පයිරුපාසන කළ යුතු පුද්ගලයෙක් ඇත.
3. සත්කාර කොට ගෞරවයෙන් යුතු ව සේවනය කළ යුතු, ඇසුරු කළ යුතු, පයිරුපාසන කළ යුතු පුද්ගලයෙක් ඇත.

**සේවනය නොකළ යුතු ඇසුරු නොකළ යුතු පයිරුපාසන නොකළ යුතු පුද්ගලයා කවුරුන් ද?**

මෙලොව ඇතැම් පුද්ගලයෙක් සීලයෙන්, සමාධියෙන් හා ප්‍රඥාවෙන් තමාට වඩා පහත් වේ ද නීච වේ ද මෙබඳු පුද්ගලයා කරුණාවෙන් මිස අනුකම්පාවෙන් මිස සේවනය නොකළ යුතුය. ඇසුරු නොකළ යුතුය. පයිරුපාසන නොකළ යුතුය.

**සේවනය කළ යුතු ඇසුරු කළ යුතු පයිරුපාසන කළ යුතු පුද්ගලයා කවුරුන් ද?**

මෙලොව ඇතැම් පුද්ගලයෙක් සීලයෙන්, සමාධියෙන් හා ප්‍රඥාවෙන් තමන් හා සමාන වේ ද මෙබඳු පුද්ගලයා සේවනය කළ යුතුය. ඇසුරු කළ යුතුය. පයිරුපාසන කළ යුතුය.

ඊට හේතු කවරේ ද යත්;

සීලයෙන් සමාන භාවයට ගියා වූ අප අතර සීල කථාවක් ද වෙයි. අපගේ සීල කථාව පවතින්නක් ද වෙයි. අපගේ සීල කථාව අපට පහසු ද වෙයි.

සමාධියෙන් සමාන භාවයට ගියා වූ අප අතර සමාධි කථාවක් ද වෙයි. අපගේ සමාධි කථාව පවතින්නක් ද වෙයි. ඒ සමාධි කථාව අපට පහසු ද වෙයි.

ප්‍රඥාවෙන් සමාන භාවයට ගියා වූ අප අතර ප්‍රඥා කථාවක් ද වෙයි. අපගේ ප්‍රඥා කථාව පවතින්නක් ද වෙයි. ඒ ප්‍රඥා කථාව අපට පහසු ද වෙයි.

මෙසේ හෙයින් මෙබඳු පුද්ගලයා සේවනය කළ යුතුය. ඇසුරු කළ යුතුය. පයිරුපාසන කළ යුතුය.

**සත්කාර කොට ගෞරවයෙන් යුතුව සේවනය කළ යුතු ඇසුරු කළ යුතු පුද්ගලයා කවුරුන් ද?**

මෙලොව ඇතැම් පුද්ගලයෙක් සීලයෙන්, සමාධියෙන් හා ප්‍රඥාවෙන් තමාට වඩා වැඩි නම් සත්කාර කොට, ගෞරවයෙන් යුතු ව සේවනය කළ යුතුය. ඇසුරු කළ යුතුය.

ඒ කවර හෙයින් ද යත්;

මෙසේ ඇසුරු කොට,

සම්පූර්ණ නොවූ සීල ස්කන්ධය (රාශිය) සම්පූර්ණ කරන්නෙමි හෝ සම්පූර්ණ වූ සීල ස්කනධය ඒ ඒ තන්හි ප්‍රඥාවෙන් අනුග්‍රහ (දියුණු) කරන්නෙමි.

සම්පූර්ණ නොවූ සමාධි ස්කන්ධය සම්පූර්ණ කරන්නෙමි හෝ සම්පූර්ණ වූ සමාධි ස්කන්ධය ඒ ඒ තන්හි ප්‍රඥාවෙන් අනුග්‍රහ කරන්නෙමි.

සම්පූර්ණ නොවූ ප්‍රඥා ස්කන්ධය සම්පූර්ණ කරන්නෙමි හෝ සම්පූර්ණ වූ ප්‍රඥා ස්කන්ධය ඒ ඒ තන්හි ප්‍රඥාවෙන් අනුග්‍රහ කරන්නෙමි.

එහෙයින් මෙබඳු පුද්ගලයා සත්කාර කොට, ගෞරවයෙන් යුතු ව සේවනය කළ යුතුය. ඇසුරු කළ යුතුය. පයිරුපාසන කළ යුතුය.

- තමන් ට වඩා හීන පුද්ගලයන් ඇසුරු කරන්නා පිරිහෙයි.
- තමන් හා සමාන පුද්ගලයන් ඇසුරු කරන්නා කිසි කලෙකත් නොපිරිහෙයි.
- තමන් ට වඩා ශ්‍රේෂ්ඨ පුද්ගලයා වෙත නැමෙන පුරුෂයා වහා වැඩෙයි.

එහෙයින් තමාට වඩා ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකු ඇසුරු කළ යුත්තේ ය.